
## නිපුණතා මට්ටම 1.7 : රංග භූමි වර්ග හඳුනා ගනියි.



නූතන රංග භූමිය (පින්තූර රාමු) කොටස් නවයකට (09) බෙදා දක්වයි. මෙය මනඃකල්පිත ව බෙදෙන ලද්දකි. මෙය හඳුනා ගැනීම තුළින් රංගන ශිල්පීන්ට හා වේදිකා පරිපාලකයින්ට තම කටයුතු කිරීමේ දී වඩාත් පහසු වේ. ඊට අමතරව නාට්‍ය අධ්‍යක්ෂකට තම 'අධ්‍යක්ෂ පිටපත' තුළ සටහන් තබා ගැනීමටත්, ආලෝක ශිල්පියාට 'ආලෝක පිටපත' සකසා ගැනීමටත්ත්, පසුතල ශිල්පියාට පසුතලය සැළසුම් කිරීමටත් ප්‍රයෝජනවත් ය.

වෘත්තාකාර වූ සොකරි රංග භූමියේ වටේටම සිට නාට්‍ය නැරඹිය හැකියාව තිබුනි. කරළිය නම් වූ අර්ධ කවාකාර නාඩගම් රංග භූමියේ ද තුන් පැත්තකින් සිට නාට්‍ය නැරඹීමට හැකියාව තිබුනි. නූතන වේදිකාවේ (ප්‍රොසීනියම්) නාට්‍ය නැරඹිය හැක්කේ එක් පසෙක සිට පමණකි

පහත ආකාරයට වේදිකාව බෙදා දැක්වීම ප්‍රචලිත වී ඇත.




වේදිකා භූගෝලයේ සරළ කල්පිත බෙදීම

1) යටි වේදිකාව දකුණ (*Downstage Right*) - *DR*
2) යටි වේදිකාව මැද ( *Downstage Center*) - *DC*
3) යටි වේදිකාව වම ( *Downstage Left*) - *DL*
4) (මැද) වේදිකාව දකුණ (*Stage Right*) - *RC*


5) (කේන්ද්‍රය) මැද වේදිකාව (*Center*) - *C*
6) (මැද) වේදිකාව වම ( *Stage Left*) - *LC*
7) උඩු වේදිකාව දකුණ (*Upstage Right*) - *UR*
8) උඩු වේදිකාව මැද ( *Upstage Center*) - *UC*
9) උඩු වේදිකාව වම ( *Upstage Left*) - *UL*






යාග භූමිය

කමත



කෝලම් රඟමඬල




Download from
Dreamstime.com
This watermarked comp image is for previewing purposes only.
ID 57900895
Throughthelens2014 | Dreamstime.com